
# හා පැංචට හොඳ වැඩේ



හසිනි අනුත්තරා රණසිංහ

# හා පැංචට
# හොඳ වැඩේ

**හසිනි අනුත්තරා රණසිංහ**

## කතුවරයාගේ වෙනත් කෘති

1. Poppy and the Mermaid - 2023
2. කවිනි සිරිපාදේ ගියපු දා

## කතාව සහ චිත්‍ර

හසිනි අනුත්තරා රණසිංහ,
අංක 7/28,
ජේ්‍රජ් ඊ ද සිල්වා මාවත,
රොස්මන්ඩ් ප්ලේස්,
මහනුවර.

ISBN 978-624-208-572-2
2025-02-08

## පිදුම

ලේඛන කටයුතුවලට නිතර

ජය සතුට පතන...

අවවාද අනුශාසනා දෙමින්

මා දිරිමත් කළ

මාගේ දයාබර දෙමාපියන් දෙපලටත්

මාගේ ගුරුමෑණිවරුන්ටත් මෙය

උපහාරයක් ම වේවා !....

# පෙරවදන

සාහිත්‍යය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි. ලක් ඉතිහාසයේ කෝට්ටේ, දඹදෙණි යුග කැපී පෙනෙන්නේ ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධවත් කාලපරිච්ඡේද නිසාය. එසේ නම් මහාමායා ඉතිහාසයේ ද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි. පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩ නගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්ත කර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාව ම ඊට සම්බන්ධ කර ගැනීමට අප ගත්කතුවරියන් සමත්වීම සුවිශේෂ සිදුවීමකි.

ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාවම ආදි කතෘ කරඳන අත්ථදස්සි මාහිමිපාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂුන් වහන්සේලා ද ග්‍රන්ථකරණයට යොමු කරන ''හෙරණගත්කරණී'' ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය.

මෙම ශාස්ත්‍රිය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇති කරන්නට නායකත්වයදීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි. ජීවිතයේ මුල් අවධියේම තම සහජ කුසලතාව හඳුනාගනිමින් ලේඛනකරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සඳහා අත්වැලක් වනු නො අනුමානය.

විදුහල්පතිනිය,
ශශිකලා සේනාධීර,
මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර.

# පටුන


| | |
|---|---|
| පිදුම | iii |
| පෙරවදන | iv |
| කතාව | 1 - 17 |



එකෝමත් එක කැලෑවක හා පවුලක් ජීවත් වුණා. මේ හා පවුලේ හා පැටවුන් දෙදෙනෙක් සිටියා. එක හා පැටියෙක්ගේ නම පැංචා අනිත් හා පැටියාගේ නම පැංචි මේ දෙදෙනා නිවුන්නු. පැංචි හරිම කීකරුයි. දෙමව්පියන් දෙන අවවාද පිළිපදියි. පැංචා හරිම අකීකරුයි. දෙමව්පියන් දෙන අවවාද කිසිවක් නොපිළිපදියි.

දවසක් හා අම්මයි හා තාත්තායි. කෑම සොයාගෙන යන්න පිටත් වුණා. ඒ දෙදෙනාම යාමට පෙර හා අම්මා සහ තාත්තා අවවාදයක් දුන්නා. කොහේවත් යන්න එපා කියලා. ඉතින් හා අම්මයි, තාත්තායි පිටත් වුණාට පසු ව පැංචි ගෙදර වැඩ කරන්න පටන් ගත්තා. පැංචා හරි ආසයි සෙල්ලම් කරන්න. ඉතින් පැංචා එයාගේ පිත්ත සහ ක්‍රිකට් බෝලය අරගෙන යන්න හදන කොටම පැංචි කිව්වා පැංචාට යන්න එපා කියලා. එත් පැංචා ඇහුවේ නෑ එයා පැංචිට බැන්නා, පැංචිට ගොඩක් දුක හිතුනා. එයා මුකුත් කියන්නේ නැතිව එයාගේ පාඩුවේ වැඩ කරා. ඒ වේලාවේ පැංචා හෙමින් ගෙදර ඇරගෙන ගියා කැලෑව ඇතුළට සෙල්ලම් කරන්න යාළුවෙක් හොයා ගන්න. ඉතින් ඔහොම ටික දුරක් යනකොට පැංචට හම්බ වුණා තරා අම්මා පැටවුන්ට පීනන්ට කියලා දෙනවා.

පැංචා තරා අම්මාගෙන් ඇහුවා ''සෙල්ලම් කරන්න එනවාද කියලා'' තරා අම්මාට හොඳටම තරහ ගිහිල්ලා පැංචාට බැන්නා තරා පැටව් පැංචව වට කරගෙන පැංචට හොඳටම කෙටුවා. පැංචාට ගොඩක් රිදුණා. එයා වේගෙන් දුවලා ගිහිල්ලා ළඟ තිබුණ ලොකු පඳුරක හැංගුණා. පැංචා ආයෙත් ගමන ආරම්භ කළා.



මේ වේලාවේ පැංචි තවම ඉස්කෝලේ දුන්න වැඩ කරනවා. ඔහොම යනකොට එයාට සද්දයක් ඇහුණා. එයා ඒ සද්දේ හොඳටම ඇහෙනකම් ගියා. පැංචාට ඒ හඬ ඇහුණේ කවුරු‍ හරි සෙල්ලම් කරන සද්දයක් වගේ. ඒකයි පැංචා ගියේ නැතිනම් පැංචා බයයි  යන්න, එයාට ගුහාවක් හම්බ වුණා සද්දේ ඇවිල්ලා තියෙන්නේ ඒ ගුහාවෙන්, පැංචා ගුහාව ඇතුළට එබිලා බැලුවා එයා දැක්කා වලස් පැටව් දෙදෙනෙක් සෙල්ලම් කරනවා.

පැංචා වලස් පැටව් දෙදෙනාගෙන් ඇසුවා සෙල්ලම් කරන්න එන්න පුළුවන් ද කියලා වලස් පැටව් දෙන්නා හිනාවෙලා මෙහෙම කිව්වා. ''ඔයා එන්න අපේ සෙල්ලමට මොන විහිළුවක්ද,'' වලස් පැටව් දෙන්නා පැංචව හුරලා පන්න පන්න එලෙව්වා. එයා පණ බේරාගෙන එතැනින් දිව්වා.



ඒ වේලාවේ පැංචාට හොඳටම බඩගිනි වුණා. පැංචාට රස කෑම සුවඳක් ආවා. එතකොට එයා ගම්මානයකට ආවා. පැංචා පුංචි ගෙදරක් දැක්කා. එයා ජනේලයෙන් එබිලා බැලුවා. එයා දැක්කා පුංචි බබෙක් ඇඳක නිදාගෙන ඉන්නවා. එයා ජනේලයෙන් ඇතුළට පැන්නා.

පුංචි බබත් එක්ක සෙල්ලම් කරන්න. එතකොට ඒ බබා අඬන්න ගත්තා. ඒ වේලාවේ ඒ බබාගේ අම්මා ඇවිල්ලා ළඟ තිබුණ ලොකු පොල්ලක් අරගෙන පැංචාට ගැහුවා.



පැංචා ඉක්මනින් ජනේලයෙන් පැන්නා. එයා දුකෙන් අඬ අඬ ගෙදර ගියා. එතකොට එයාට ඒ ගොල්ලන්ගේ ගෙදරින් සද්ද ඇහුණා. පැංචා දුවලා ගිහිල්ලා දොර ඇරියා.



එයා දැක්කා හා පැටව් දෙදෙනාගේ යාළුවෝ ඇවිල්ලා පැංචි එක්ක සෙල්ලම් කරන්න. පැංචි කිව්වා පැංචාට ඔයා මෙච්චර දුර යන්න ඕන නැහැ සෙල්ලම් කරන්න, යාළුවෙක් හොයන්න.

පැංචා ලැජ්ජාවෙන් එයාගේ කාමරයට ගියා. එතකොටම හා අම්මායි හා තාත්තයි ඇවිල්ලා පැංචාට බැන්නා. ඊට පස්සේ හා තාත්තා පැංචාව අලි වෙද රාළ ගාවට එක්ක ගියා. පැංචා රෝහලේ දවස් පහක් විතර හිටියා. එදා ඉඳන් පැංචා පැංචි වගේම හොඳ වුණා.


Hospital

# පසුවදන



රටේ අනාගත සංවර්ධනයට ඉවහල් වන සාහිත්‍යය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මණකරණය විභවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප්නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩ නැගීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමු කරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකුර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දළුලා වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි. පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ ඵලදායිතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප, පළාත්, ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි.

මෙවර ඒ සදහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහිදී මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පතිතුමිය, දියණියන්, ගුරුභවතුන්, දෙමාපියන් සහ ආදි ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුය.

මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකිය. මානව දැනුම ගබඩාකර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත් සමඟ දරුවන් එයින් දූරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරී මෙන්ම සමාජය තුළ විවිධ ගැටලු ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මක ව සනාථ වෙයි. මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනා කර ඩිජිටල් තාක්ෂණය යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාකෂණය සමග ගළපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමග එක්ව විද්‍යුත් කෘති රචනාකරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙනයාමට මහාමායා බාලිකාවයන් ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දී තිබේ තම නිසඟ, සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුභාෂිංසන.

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක,
සෙනෙවිරත්න මහලේකම්